# <u>නිවේදනය</u> A

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව අනුව **"විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය"** නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඉදිරිපත් කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දැන්වීමට කැමැත්තෙමි.

පනත් කෙටුම්පතෙහි 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15, 16, 19, 20, 21, 22, 23, 26, 27, 28, 29, 30, 32, 34, 35, 36 සහ 37 වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84 (2) ව්‍යවස්ථාවේ විධිවිධානයට අනුව විශේෂ බහුතර ඡන්දයකින් සහ ජනමත විචාරයකදී ජනතාව විසින් අනුමත කිරීමෙන් අනුමත කළ යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කොට ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණය තවදුරටත් තීරණය කර ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82 (5) ව්‍යවස්ථාවට අනුව පනත් කෙටුම්පතේ 17, 18, 24, 25, 31 සහ 33 වගන්ති විශේෂ බහුතර ඡන්දයකින් සම්මත කළ හැකි බවයි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතුයැයි නියෝග කරමි.